IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2013

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2014 ඔක්තෝම්බර්)

## BLE 104 - කළමනාකරණ මූලධර්ම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (අ) විද්වත් නිර්වචන ආශ්‍රයෙන් කළමනාකරණය නිර්වචනය කරන්න. කළමනාකරණ විෂයයේ ස්වභාවය කළමනාකරණ ක්‍රියාවලිය ආශ්‍රයෙන් විස්තර කරන්න.

(ලකුණු 09)

(ආ) කළමනාකරණ කුසලතා සහ භූමිකා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(ඇ) කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලිය විග්‍රහ කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 25)

02. (අ) සැලසුම්කරණය නිර්වචනය කර සැලසුම්කරණයේ ප්‍රයෝජන ඉදිරිපත් කරන්න.

(ලකුණු 09)

(ආ) ඔබ දන්නා ආයතනයක අරමුණු ප්‍රකාශනය ( Mission Statement ) ඉදිරිපත් කර කළමනාකරණ දෘෂ්ටියකින් එය ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 08)

(ඇ) අභ්‍යන්තර හා බාහිර න්‍යාසය ( IE matrix ) ආශ්‍රයෙන් සමස්ථ උපාය මාර්ග තෝරාගන්නා ආකාරය පැහැදිළි කරන්න.

ලකුණු 08)

(මුළු ලකුණු 25)

03. පහත සඳහන් මාතෘකා පහක් (05) පිළිබඳ සටහන් ලියන්න.

(i) පාලන සීමාව

(ii) ශ්‍රම විභාජනය සහ විශේෂීකරණය

(iii) දෙපාර්තමේන්තුගත කිරීම

(iv) අධිකාරිය පැවරීම

(v) මධ්‍යගත සහ විමධ්‍යගත භාවය

(vi) සංවිධාන කාර්යය

(ලකුණු 05x05= මුළු ලකුණු 25)

04. (අ) නායකත්ව බල මූලාශ්‍ර විස්තර කරන්න.

(ලකුණු 09)

(ආ) "නායකත්ව දැලෙහි ප්‍රශස්ථම ස්ථානය 9.9 වේ."
ඉහත ප්‍රකාශනය සමග ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 08)

(ඇ) "ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන් බහුතරයක් තාමත් ගතකරන්නේ අවශ්‍යතා ධූරාවලියේ පළමු අධියරේය." විවේචනාත්මකව විග්‍රහ කරන්න.

ලකුණු 08)

(මුළු ලකුණු 25)